**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.2,163,094 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබෙන රථගාලේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂ සඳහා ගිණුම්ගත කර තිබුණු ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම පිළිවෙලින් රු.600,000 ක් හා රු.300,000 ක්වූ අතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාදී ඇති තොරතුරු අනුව අදාල වර්ෂ දෙක සඳහා වූ මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,192,260 ක් හා රු.1,652,000 ක් විය. ඒ අනුව අදාල මුද්දර ගාස්තු සඳහා ගැලපීම් නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා හිඟහිටි මුද්දර ගාස්තු රු.1,944,260 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.2,709,124 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.794,018 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 වරිපනම් බදු

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර එම ප්‍රදේශ තුල පිහිටියා වූ නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකිරීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.2 බදුකුලී

---------

(අ) සභාව සතු කලාවැව ගවමස් කඩය හා කුකුළු මස්කඩය සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බදු ගෙන තිබුණු බදුකරුවන් දෙදෙනා විසින් ගෙවීම් පැහැර හැර තිබුණු රු.331,317 ක්වූ මුදල අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු කඩකාමර බදු ගෙන තිබුණු බදුකරුවන් 58 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු රු.183,930 ක්වූ මුදල අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයවියයුතුව තිබෙන රු.1,887,781 ක්වූ උසාවි දඩ ආදායම අයකර ගැනීම සඳහාවූ පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වනවිට මුද්දර ගාස්තු ආදායම රු.1,267,211 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද, 2013 හා 2014 වර්ෂ සඳහා සභාව වෙත අයවියයුතු නිවැරදි මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර හිඟහිටි මුද්දර ගාස්තු මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.4 වෙනත් ආදායම්

------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වනවිට බදුකරුවන් 182 දෙනෙකුගෙන් අයවියයුතුව තිබෙන රු.190,685 ක්වූ කසල බදු මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබෙන වෙළඳ දැන්වීම් පුවරුවලින් අයවියයුතු බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේදී සභාව වෙත ලබාදී තිබුණු පරිගණක 02 ක සහ එම උපාංගවල වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ආ) 2015 ප්‍රාදේශීය සභා විමධ්‍යගත අයවැය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම යටතේ සමාලෝචිත වර්ෂය තුල රු.237,500 ක් සහ රු.50,000 ක් වැයකර පිළිවෙලින් ප්ලාස්ටික් පුටු 341 සහ ජෙනරේටර් 04 ක් මිලදී ගෙන තිබුණු අතර, එම උපකරණ සභාවේ ගබඩාවට භාරගත් බවටවූ සටහන් තබා නොතිබුණි.තවද රු.64,773 ක්වූ පුටු 93 ක් සහ රු.25,000 ක්වූ ජෙනරේටර් 02 ක් ප්‍රතිලාභීන්ට බෙදාදීම සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඇ) එක් අවස්ථාවකදී ලබාදිය හැකි අතුරු අග්‍රිමයක උපරිම සීමාව රු.100,000 ක් වුවත් එම සීමාව ඉක්මවා 2015 අප්‍රේල් 10 දින ක්‍රීඩා උත්සවයක් සඳහා රු.300,000 ක් ලබාදී තිබුණු අතර මෙම අත්තිකාරම් මුදල 2016 මැයි 18 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නව සභා කාර්යාලයට රු.614,872 ක්වූ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

**3.2** **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සරසවි සංහිඳ කලා උළෙල පැවැත්වීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව රු.103,890 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි.

**3.3** **වත්කම් කළමනාකරණය**

**නිශ්ක්‍රීය වත්කම්**

වටිනාකම රු.1,622,000 ක්වූ වාහනයක සහ යන්ත්‍ර උපකරණ 04 ක් වර්ෂ කීපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**04.** **පද්ධති හා පාලනය**

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය